# සෞඛ්‍ය, දේශීය වෛද්‍ය සමාජ සුබසාධන
# පරිවාස හා ළමාරක්ෂක සේවා කටයුතු පිළිබඳ අමාත්‍යාංශය

# පුරප්පාඩු

## සමාජ සුබසාධන පරිවාස හා ළමාරක්ෂක සේවා කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුව

01. මධ්‍යම පළාත් රාජ්‍ය සේවයේ සමාජ සුබසාධන, පරිවාස හා ළමා රක්ෂක සේවා දෙපාර්තමේන්තුවේ බඹරදෙණිය, වෙලම්බඩ, පිහිටි වේරවලවත්ත ළමා රැඳවුම් නිවාසයේ සහ උඩපේරාදෙණියේ පිහිටි, විකිර් සෙවණ රජයේ භාර ගැනීමේ ළමා නිවාසයේ පුරප්පාඩුව පවතින, පහත සඳහන් තනතුරු සඳහා පුරප්පාඩු පිරවීමට මධ්‍යම පළාත තුළ පදිංචි සුදුසුකම්ලත් අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

| පුරප්පාඩු සංඛ්‍යාව | | | තනතුරු පුරප්පාඩු |
|---|---|---|---|
| 1.1 | මේට්‍රන් තනතුර (පිරිමි) | - | 01 |
| | මේට්‍රන් තනතුර (කාන්තා) | - | 01 |
| 1.2 | උප මේට්‍රන් තනතුර (පිරිමි) | - | 01 |
| 1.3 | උප වෝර්ඩන් තනතුර (පිරිමි) | - | 01 |
| 1.4 | පෙරපාසල් ගුරු (කාන්තා) | - | 01 |
| 1.5 | ඕවර්සියර් තනතුර (කාන්තා) | - | 02 |
| 1.6 | කෝකි මාතා තනතුර (කාන්තා) | - | 04 |

02. **පොදු සුදුසුකම්**

2.1 ශ්‍රී ලාංකිකයකු විය යුතුය.

2.2 විශිෂ්ට චරිතයකින් හා මනා ශරීර සෞඛ්‍යයකින් යුක්ත විය යුතුය.

2.3 අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට පූර්වාසන්න වසර තුනක අඛණ්ඩ ස්ථිර පදිංචියක් මධ්‍යම පළාත් සභා බල ප්‍රදේශය තුළ ඇති බවට පිළිගත හැකි ලිඛිත සාක්ෂි ඉදිරිපත් කළ යුතුයි. අදාළ නිවාසය පිහිටි දිස්ත්‍රික්කය තුළ පදිංචි අය කෙරෙහි වැඩි සැලකිල්ලක් දක්වනු ලැබේ.

2.4 දණ්ඩ නීති සංග්‍රහය යටතේ උසාවියකින් දඬුවම් නොලැබුවෙකු විය යුතුය.

03. **මේට්‍රන් තනතුර**

3.1. **වැටුප් පරිමාණය** : රු. 27140-10X300-11X350-10X495-10X660-45540 (MN 1-2016)

3.2. **වයස** : අයදුම්කරුවන් වයස අවුරුදු 25 ට නොඅඩු හා 45 ට නොවැඩි අය විය යුතු අතර, දැනටමත් මධ්‍යම පළාත් රාජ්‍ය සේවයේ නියුතු අයට උපරිම වයස් සීමාව අදාළ නොවේ.

3.3. (අ) **අධ්‍යාපන සුදුසුකම්** : අ.පො.ස. (උසස් පෙළ) විභාගයෙන් එකවර විෂයන් තුනකින් සමත්ව තිබීම

සහ

(ආ) රජයේ හෝ පිළිගත් පෞද්ගලික රෝහලක හෙදි තනතුරේ අවම වශයෙන් වසර 02ක පළපුරුද්දක් තිබීම.

04. **උප මේට්‍රන් තනතුර**

4.1. **වැටුප් පරිමාණය** : රු. 27140-10X300-11X350-10X495-10X660-45540 (MN 1-2016)

4.2. **වයස** : අයදුම්කරුවන් වයස අවුරුදු 25 ට නොඅඩු හා 45 ට නොවැඩි අය විය යුතු අතර, දැනටමත් මධ්‍යම පළාත් රාජ්‍ය සේවයේ නියුතු අයට උපරිම වයස් සීමාව අදාළ නොවේ.

4.3. (අ) **අධ්‍යාපන සුදුසුකම්** : අ.පො.ස. (උසස් පෙළ) විභාගයෙන් එකවර විෂයන් තුනකින් සමත්ව තිබීම

සහ

(ආ) රජයේ ලියාපදිංචි කරන ලද ස්වේච්ඡා ළමා නිවාසයක වසර 05 ට නොඅඩු මේට්‍රන් තනතුරේ පළපුරුද්දක් ඇති උක්ත සුදුසුකම් සහිත අයට විශේෂ සැලකිල්ලක් දක්වනු ලැබේ.

05. **උප වෝර්ඩන් තනතුර**

5.1. **වැටුප් පරිමාණය** : රු. 27140-10X300-11X350-10X495-10X660-45540 (MN 1-2016)

5.2. **වයස** : අයදුම්කරුවන් වයස අවුරුදු 25 ට නොඅඩු හා 45 ට නොවැඩි අය විය යුතු අතර, දැනටමත් මධ්‍යම පළාත් රාජ්‍ය සේවයේ නියුතු අයට උපරිම වයස් සීමාව අදාළ නොවේ.

5.3. (අ) **අධ්‍යාපන සුදුසුකම්** : අ.පො.ස. (උසස් පෙළ) විභාගයෙන් එකවර විෂයන් තුනකින් සමත්ව තිබීම

සහ

(ආ) ශාරීරික අධ්‍යාපන පාඨමාලා හදාරා ඇති අයදුම්කරුවන් කෙරෙහි වැඩි සැලකිල්ලක් දක්වනු ලැබේ. (මෙම පාඨමාලා හා පුහුණු අවම වශයෙන් මාස 06 ක් වත් අඛණ්ඩව හදාරා සහතිකයක් ලබා තිබිය යුතුය)

06. **පෙර පාසල් ගුරු තනතුර**

6.1. **වැටුප් පරිමාණය** : රු. 27140-10X300-11X350-10X495-10X660-45540 (MN 1-2016)

6.2. **වයස** : අයදුම්කරුවන් වයස අවුරුදු 18 ට නොඅඩු හා 30 ට නොවැඩි අය විය යුතුය.

6.3. (අ) **අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම්** : සිංහල/ දෙමළ/ ඉංග්‍රීසි භාෂාව, ගණිතය සහ තවත් විෂයයන් (02) දෙකකට සම්මාන සාමාර්ථයන් සහිතව එකවර විෂයයන් (06) හයකින් අ.පො.ස. (සා/පෙළ) විභාගය සමත්වී තිබීම.

සහ

(ආ) අ.පො.ස. (උ/පෙළ) විභාගයේදී අවම වශයෙන් විෂයයන් එකක්වත් (01) (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) සමත්ව තිබීම.

(ඇ) රජයේ පිළිගත් ආයතනයකින් ලබාගත් වර්ෂයකට නොඅඩු පෙර පාසල් ඩිප්ලෝමා සහතිකය.

6.4. **පළපුරුද්ද** : ස්වේච්ඡා ආයතනයක හෝ රජයේ ළමා නිවාසයක පෙර පාසල් ගුරු තනතුරේ වසර 05 ට නොඅඩු කාලයක් කටයුතු කර තිබීම.

07. **ඕවර්සියර් තනතුර**

7.1. **වැටුප් පරිමාණය** : රු. 27140-10X300-11X350-10X495-10X660-45540 (MN 1-2016)

7.2. **වයස** : අයදුම්කරුවන් වයස අවුරුදු 18 ට නොඅඩු හා 30 ට නොවැඩි අය විය යුතුය.

7.3. (අ) **අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම්** : සිංහල/ දෙමළ/ ඉංග්‍රීසි භාෂාව, ගණිතය සහ තවත් විෂයයන් (02) දෙකකට සම්මාන සාමාර්ථයන් සහිතව එකවර විෂයයන් (06) හයකින් අ.පො.ස. (සා/පෙළ) විභාගය සමත්වී තිබීම.

සහ

(ආ) අ.පො.ස. (උ/පෙළ) විභාගයේදී අවම වශයෙන් විෂයයන් එකක්වත් (01) (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) සමත්ව තිබීම.

සහ

(ඇ) තනතුරට පැවරෙන කාර්යයන්හි ස්වභාවය අනුව අවශ්‍ය වන වෘත්තීය සුදුසුකම් පළපුරුද්ද ඇතුළු වෙනත් සුදුසුකම්.

08. **කෝකි මාතා තනතුර**

8.1. **වැටුප් පරිමාණය** : රු. 25250-10X270-10X300-10X330-12X350-38450

8.2. **වයස** : අයදුම්කරුවන් වයස අවුරුදු 18 ට නොඅඩු හා 45 ට නොවැඩි අය විය යුතුය.

8.3. (අ) **අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම්** : අ.පො.ස. (සා/පෙළ) විභාගයේ දෙවරකට නොවැඩි වාර ගණනකදී යටත් පිරිසෙන් සම්මාන 2 ක් සහිතව විෂයයන් 6 කින් සමත් වී තිබීම.

(ආ) රජයේ පිළිගත් ආයතනයකින් ලබාගත් වෘත්තීය කුසලතා, (NVQ) දෙවන හෝ තුන්වන මට්ටමට නොඅඩු නිපුණතාවයක් ලබාගෙන තිබිය යුතුය. (ආහාර පිසීම සම්බන්ධව)

මෙම තනතුරු ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින් සුදුස්සන් තෝරාගනු ලැබේ. තමන් විසින්ම සකස් කරන ලද අයදුම්පත්‍රය 2017-03-13 දින ට පෙර හෝ එදා පෙර ලැබෙන සේ ලේකම්, සෞඛ්‍ය දේශීය වෛද්‍ය සමාජ සුභසාධන පරිවාස හා ළමාරක්ෂක සේවා කටයුතු පිළිබඳ අමාත්‍යාංශය, තැ.පෙ. 121, සංඝරාජ මාවත, මහනුවර යන ලිපියට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. තනතුරේ නම ලියුම් කවරයේ වම්පස ඉහළ කෙළවරෙහි සඳහන් කළ යුතුය. නියමිත දිනට පසුව ලැබෙන අයදුම්පත්, අසම්පූර්ණ අයදුම්පත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. තැපෑලේදී අස්ථාන ගත වන අයදුම්පත් සම්බන්ධයෙන් මෙම අමාත්‍යාංශය වගකියනු නොලැබේ.